# නව යොවුන්වියේ සමාජානුයෝජනය

කළුබෝවිටියන සෝරත හිමි

## ප්‍රවේශය

පුද්ගල සමාජානුයෝජනයේ දී විශේෂ සංක්‍රාන්තික අවධියක් ලෙස සැලකෙන නව යෞවන වයස් සීමාව යනු ජීවිතයේ ප්‍රබලත ම පරිවර්තන අවස්ථාවකි. පුද්ගල ජීවිතය වනාහි නිරතුරු ව ම වෙනස්වන ප්‍රපඤ්චයකි. මානව ලෝකයේ සෑම පුද්ගලයෙකු ම ළදරු කාලය, ළමා කාලය, තරුණ කාලය පසු කරමින් වැඩිහිටි හෙවත් වයෝවෘද්ධ කාල සීමාව වෙත ගමන් කරයි. යොවුන් විය සරල අර්ථයක් සහිත වචනයක් ලෙසින් ගම්‍යමාන වුව ද මෙය උප බෙදීම් කිහිපයක් යටතේ හඳුනාගත හැකි සංකල්පයක් වනවා සේ ම එහි දී නව යොවුන් විය යනු පුද්ගල ජීවිතයේ ඉතා වැදගත් කාලපරිච්ඡේදයක් වේ. නව යොවුන් වියට අයත් වයස් පරාසය විවිධ ලෙස අර්ථ දක්වන අතර, එය අවු. 10ක ආරම්භයේ සිට අවු. 19 තෙක් දිවෙන කාලයක් ලෙස සාමාන්‍යයෙන් සැලකේ. එහෙත් ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතියට අනුව අවු. 10-24 දක්වා කාල සීමාව යොවුන් විය ලෙස හඳුන්වයි. යෞවනෝදයට අනුව අවු. 10-24 දක්වා කාල සීමාව යොවුන්විය ලෙස හඳුන්වයි. යෞවනෝදයට එළඹීම හෙවත් මල්වර වීම නව යොවුන්වියේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සලකන අතර පුද්ගල සංවර්ධනයේ පරිවර්තන කාල පරිච්ඡේදයක් ලෙස ද හඳුන්වයි. මෙයට හේතුව මෙම අවධිය ළමා වියත්, වැඩිහිටි වියත් අතර අතරමැදි අවධිය වන බැවිනි.

- අවු. 10 - 13 = මුල් යොවුන් විය.
- අවු. 14 - 16 = මැද යොවුන් විය.
- අවු. 17 - 19 = පසු යොවුන් විය.

යෞවනත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී නිතර ම හමුවන යෞවනෝදය හා නව යෞවනය යන්න එකිනෙකට සමාන

සංකල්ප දෙකක් වශයෙන් පෙනුණ ද සැබැවින් ම මෙය එකිනෙකට වෙනස් අර්ථ දෙකකින් සමන්විතය. යෞවනෝදය යනු කෙටි කලයක දී සිදුවන ශාරීරික වෙනස්වීම් වන අතර මෙය ශාරීරික වශයෙන් ලිංගික පද්ධතිය පරිණතියට පත් වීමක් ලෙසින් ද හැඳින්විය හැකි ය. යෞවනෝදයට පත් වීමට ගැහැණු දරුවෙකු මාස හයක් පමණ කාලයක් ගත වුව ද පිරිමි දරුවන් අවුරුදු දෙකක් පමණ කාලයක් ගත කරයි. නව යොවුන් විය එසේත් නැත්නම් නව යෞවනය යන්න යෞවනෝදය තරමක් වෙනස් සංකල්පයක් වශයෙන් අර්ථ දැක්විය හැකි ය. නව යොවුන් අවධියෙහි පුද්ගලයකුගේ ශාරීරික, බුද්ධිමය හා චිත්තවේගික වශයෙන් ශීඝ්‍ර වර්ධනයක් සිදු වීම කැපි පෙනෙන ලක්ෂණයකි. යෞවනෝදය හා නව යෞවනය එකට ඇරඹෙන නමුදු නව යෞවන අවධිය දිගු කාලයක් පවතී. එනම් අවුරුදු 8-10 කාලයක් විය හැකි ය. ඒ අනුව යෞවනෝදය ශාරීරික පරිවර්තනයක් ලෙසින් ද නව යොවුන් අවධිය පුද්ගලයකුගේ සමස්ත ජීවිතයම පරිවර්තනයක් ඇති කරනු ලබන අසමසම යුගයක් ලෙසින් ද හැඳින්විය හැකිය. ඒ අනුව පුද්ගලයාගේ යොවුන් අවධියේ සමාජානුයෝජන ක්‍රියාවලිය පුද්ගල සංවර්ධනයෙහි ලා කැපීපෙනෙන සාධකයකි. නව යොවුන්විය සංවර්ධනයෙහිලා හා සමජානුයෝජන ක්‍රියාවලියේ බලපෑම පිළිබඳව මෙහි දී විමර්ශනයට ලක් කෙරේ.

## නව යොවුන්විය

නව යෞවනය හැඳින්වීමට භාවිතා කරනු ලබන “Adolescence” යන වචනයෙහි සම්භවය වෙත අවධානය යොමු කිරීමේ දී එය Grow to Maturity යන අර්ථකතන යෙදෙන ග්‍රීක වචනයකින් නිෂ්පන්න වී ඇති අතර මෙහි අර්ථය නම්, පරිණතිය කරා වර්ධනය වීම යන්න යි. මෙහි දි අප හඳුනාගන්නා පරිණතිය නම් නව යෞවනයාගේ ශාරීරික, ලිංගික, බුද්ධිමය, මානසික හා සමාජමය යන සමස්ත පෞරුෂ පරිණතියක් කරා ගමන් කිරීම යි. නව යෞවනය ඉතා සංකීර්ණ තත්වයක් පිළිඹිබු කරන සංකල්පයක් වන බැවින් එහි වයස් සීමාව නිවැරදි අර්ථ දැක්වීම දුෂ්කර වී තිබේ. නව යෞවනය අයත් වන වයස් සීමාව පිළිබඳ වීමසීමේ දී ඒ සඳහා විවිධ මතවාද ඉදිරිපත් වී තිබේ. ස්ටැන්ලි ගෝල්ට අනුව අවුරුදු 14 - 24 අතර කාලය ලෙසින් ද, සිඩ්නි ආර් රොලින්ස්ට අනුව අවුරුදු 13 - 19 අතර

කාලය ලෙසින් ද, ඒ. හැඩ්පීප්ට අනුව අවුරුදු 12 -18 අතර කාලයේ ලෙසින් ද, මේරී කොලින්ස්ට අනුව වයස අවුරුදු 11-18 අතර කාලය ලෙසින් ද, ගෙසල්ට අනුව අවුරුදු 10-16 අතර කාලය ලෙසින් ද, සී. එම්. ප්ලෙමින්ට අනුව අවුරුදු 12-20 අතර කාලය ලෙසින් ද, නව යොවුන්විය අර්ථ දක්වා ඇත.

නව යොවුන් විය පිළිබඳ සංකල්පය සරල ජීවවිද්‍යාත්මක සංසිද්ධියකට වඩා සංකීර්ණ මනෝ සමාජීය සංසිද්ධියක් වශයෙන් සැලකිය හැකි ය. නිවසේ පාසලේ හෝ සමාජයේ ගත කරන නව යෞවනය පිළිබඳ සංස්කෘතියෙන් සංස්කෘතියට සපයනු ලබන අර්ථකථන බහුවිධ ස්වරූපයක් දරයි. ''කිසිවකුටත් අයිති නැති භූමියක්'' ''කුණාටුවලින් ගහන වූ සමයක චිත්තවේගවල යුධ පිටියක්'' ආදී වශයෙන් විවිධ අර්ථ සපයන නමුත් වෙල්සි නමැති මනෝවිද්‍යාඥයා විසින් කරන ලද අධ්‍යයනවල ප්‍රතිඵලයක් වශයෙන් නව යොවුන් සමය අර්බුදකාරී දෙමව්පියන් සමඟ ගැටුම් ඇතිකර ගැනීමේ පෙලඹීමක් සහිත වකවානුවක් ලෙස සැලකීම සාවද්‍ය බව පැහැදිලි කරයි. ඔසුබෙල් නමැති මනෝවිද්‍යාඥවරයා දක්වන අන්දමට නව යොවුන් විය යුතුකම්, වගකීම් වරප්‍රසාද සහ අන් අය සමඟ ඇති සබඳතා පැහැදිලි වෙනස්වීම් දැකිය හැකි කාලපරිච්ඡේදයකි. මේ තත්ත්වය යටතේ තමා ගැන දෙමව්පියන් ගැන වැඩිහිටියන් හා අනෙකුත් අය ගැන ඔහු තුළ ඇතිවන ආකල්ප වෙනස් වීම තවදුරටත් වැළැක්විය නොහැකිය. බොහෝ ප්‍රාථමික සමාජවල යෞවනයන් ඍජු ලෙස වැඩිහිටි වියට පරිණත වී ලෝකයට ප්‍රවිශ්ට කරනු ලබතත් බටහිර සමාජය යෞවනයන් සංස්කෘතික වශයෙන් කිසිවකුටත් අයිති නැති භූමියක තවදුරටත් ජීවත්වන බව ලැන්ඩිස් නැමැති මනෝ විද්‍යාඥයා ප්‍රකාශ කරයි.

## නව යොවුන්විය අවධි වර්ගීකරණය

නව යොවුන් විය පිළිබඳ සියලු සමාජ හා මනුෂ්‍ය වර්ගයාට පොදු වයස් සීමාවක් නිර්ණය කිරීම යුක්ති සහගත නොවන අතර, එය සමාජයෙන් සමාජයට පුද්ගලයාගෙන් පුද්ගලයාට මෙන් ම සංස්කෘතියෙන් සංස්කෘතියට ද යම් යම් වෙනස්කම් සහිත විය හැකිය. එසේ වුවද එවැනි සුවිශේෂී වෙනස්කම්වලට ඉඩ ලැබෙන

පරිදි සාමාන්‍ය වයස් සීමාවක් දැක්වීමට නොහැකි නොවේ. ඒ අනුව ආරම්භය මෙන්ම අවසාන වයස් සීමාව පිළිබඳ ව නිශ්චිත එකඟතාවක් නැතත් පොදුවේ පිළිගනු ලබන වයස් සීමාවන් පහත පරිදි දැක්විය හැකිය.

- යෞවනෝදය (අවුරුදු 10-13)
- මධ්‍ය නව යොවුන්විය (අවුරුදු 13-16)
- පශ්චාත් යොවුන්විය (අවුරුදු 16-20)

මෙම නව යොවුන්විය නමැති සංකල්පය පිළිබඳ අදහස් දක්වන කැනේඩියානු මනෝවිද්‍යාඥ ඩේවිඩ් බේකන් පවසන පරිදි වර්තමානයේ සිට බලන විට නව යොවුන්විය පිළිබඳ සංකල්පයට අවුරුදු සියයක්වත් පැරණි ඉතිහාසයක් නැත. එය බටහිර සමාජයේ කාරමීකරණයත් නාගරීකරණයත් විසින් නිර්මාණය කරන ලද්දකි. එය යොවුන්විය පුද්ගල සංවර්ධනය පිළිබඳ ඉතා වැදගත් කාලපරිච්ඡේදයක් ලෙස සලකනු ලබන්නේ ක්ෂණික, ශාරීරික හා ලිංගික සංවර්ධනය ඔස්සේ මානසික හා චිත්තවේගික වශයෙන් ක්‍රමයෙන් පරිණතිය කරා වැඩෙන යුගයක් වශයෙනි. නව යොවුන්විය රටින් රටට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට, සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් ආකල්ප දරන සංකල්පයකි. නව යොවුන්වියේ ස්වභාවය පිළිබඳ කරුණු අධ්‍යයනයේදී නව යොවුන් සංවර්ධනයේ අංශ කිහිපයක් සලකා බැලීමෙන් එම වර්ධනයේ ප්‍රතිඵල වශයෙන් ඇතිවන අවශ්‍යතා හා කායික, මානසික තත්වයන් නව යෞවනයාගේ ස්වභාවය තීරණය කිරීමේ දී බලපාන අන්දම පැහැදිලි කිරීමට හැකිවනු ඇත. හොරොක්ස්ට අනුව එය අංශ පහක් යටතේ දක්වා ඇත.

01. කායික සංවර්ධනය

02. බුද්ධිමය හැකියා වර්ධනය

03. ස්වාධීනත්වය හා පෞරුෂ වර්ධනය

04. සමාජ සම්බන්ධතා වර්ධනය

05. ඇගයුම් රටාව සංවර්ධනය කරගැනිම.

## නව යොවුන්වියේ පොදු ලක්‍ෂණ

නව යොවුන් අවධියේ පොදුවේ දැකිය හැකි ලක්ෂණ ගණනාවක් පවතින අතර ඒවා සියල්ල එකට කැටි කොට මෙසේ දැක්විය හැකිය.

- ගැහැනු ළමයා කලින් ම පිරිමි ළමයා පසුව ද නව යොවුන් වියට එළඹේ.
- නව යොවුන්විය ආරම්භක වයස් සීමාව බොහෝදුරට අවුරුදු (11-12) වශයෙන් සැලකිය හැකිය.
- නව යොවුන්විය එළඹෙන්නේ ශාරීරික හා ලිංගික විපර්යාස සමගිනි.
- මල්වර වීම ඉහත කී කාලසීමාව තුළ විවිධ වයස් සීමාවන්හිදී සිදු විය හැකි නිසා ජන්ම වයස හා සාපේක්ෂව සංසන්දනය කළ නොහැකි ය.
- නව යොවුන්විය අවසන් වන්නේ පරිණතියට හෙවත් වැඩිහිටි භාවයට අවතීර්ණ වීමෙනි. මේ නිසා එය ද පුද්ගල හා සමාජ ස්වභාවය අනුව වෙනස් විය හැකි ය.

ජීවිතයේ වෙනත් අවධිවල දී සිදුවන වෙනස්කම් වලට වඩා අතිශයින් ම වෙනස් වූ නව යෞවනයා බාහිර පරිසරයෙන් උරාගන්නා වේගය අනුව නව යොවුන් විය දීර්ඝ කරගත හැකි අවධියක් ලෙස ද මිනිසා උපතේ සිට පළමු පස් වසර අවසානය දක්වා සිදුවන ශාරීරික වර්ධනය හැරුණුවිට එවැනි ප්‍රබල පරිවර්තනයක් නැවත සිදුවන නව යෞවනෝදය පරිවර්තනය තීව්‍ර ලෙස කැපී පෙනෙන වෙනස්කම් රාශියක් දැකගත හැකි වන අතර මූලික ව ම සමාජානුයෝජනයට ක්‍රියාවලියට සෘජුව ම සම්බන්ධවන අවස්ථාවකි. එහි දී සිදුවන වෙනස්කම් රාශියක් දැකගත හැකි ය.

- කායික හා ලිංගික වෙනස්කම්
- සමාජමය හා චිත්තවේගික වෙනස්කම්

- මනෝවිද්‍යාත්මක වෙනස්කම්
- බුද්ධිමය වෙනස්කම්
- සදාචාරමය වෙනස්කම්
- මානසික, අධ්‍යාපනික ගැටලු හා රුචි අරුචිකම්

**සමාජානුයෝජනය**

සමාජීයකරණය, අනුසංස්කෘත්‍යායනය, සමාජගත වීම යන නම්වලින් ද හැඳින්වෙන සමාජානුයෝජනය (Socialization) යනු සමාජයට අනුගත කිරීම යි. මිනිස් දරුවකු ලොවට බිහි වන්නේ සමාජ (Social) සත්ත්වයකු ලෙස නොව, ජීවවිද්‍යාත්මක (Biological) ඓන්ද්‍රියකු වශයෙනි. එසේ උපන් දරුවා සමාජයෙන් විවිධ අත්දැකීම් ආදිය ලබා ගනි. ඒ හරහා සමාජයට උචිත ලෙස අනුයෝජනය වේ. නැතිනම් හැඩගැසේ. පුද්ගලයෙකුගේ පෞරුෂය හැඩ ගැසීම කෙරෙහි උපයුක්ත කරගත හැකි චර්යාධර්ම, ආයතන හා පිළිවෙල රටා ආදිය සමාජය තුළ නිරතුරුව හට ගනී. සමාජයේ ම නැති වී නැවත නැවතත් ඇති වේ. මෙම අඛණ්ඩ සමාජ ක්‍රියාකාරිත්වය හමුවේ පුද්ගල හැඩගැස්ම ද වේගයෙන් සිදු වන අතර එහිදී පුද්ගලයා සමාජයෙන් යම් උගැන්මක් ද ලබා ගනී. එම ක්‍රියවලිය සමාජානුයෝජනය ලෙස සමාජ විද්‍යාඥයෝ හඳුන්වති. පුද්ගලයා සිය ජීවිත කාලය පුරාවට ම මේ ක්‍රියාවලියට යටත්වන අතර ජීවියෙකු වශයෙන් මිනිසාගේ කායික, මානසික සන්දර්භය සමාජානුයෝජන ක්‍රියාවලියට යටත් වීමට අවශ්‍ය හැකියාව එම තැනැත්තාට ලබා දෙයි. නිදසුන් ලෙස බිය, නින්ද, කුසගින්න, පිපාසය, වැනි ප්‍රේරණ නෛසර්ගික වශයෙන් ළදරුවා තුළ පැවතීම, අවධානයට යොමු වීමේ දැඩි ආශාවක් තිබීම, තම අවශ්‍යතා පෙන්වාදීම සඳහා යම් සන්නිවේදන ශක්තියක් පිහිටා තිබීම ආදිය දැක්විය හැකි ය. මෙබඳු සාධක නිසා ඔහු නිරායාසයෙන් ම සමාජානුයෝජන ක්‍රියාවලියට යටත් වෙයි. ඒ අනුව ජීවවිද්‍යාත්මක මිනිසා සමාජීය සත්ත්වයකු කරනු ලබන ක්‍රියාවලිය සමාජානුයා්ජනය ලෙස හඳුන්වා දිය හැකි ය. මේ ගැන විවිධ සමාජ විද්‍යාඥයන් දක්වා ඇති අදහස් විමසා බැලීමෙන් එය වඩාත් පැහැදිලි වේ.

සමාජානුයෝජනය යනු සංස්කෘතිය පවරාදීමේ ක්‍රියාවලියයි. ඊට විවිධ සාමාජීය සමූහයන්ගේ භාවිතය නීති රීති, ඉගෙනීම් ද ඇතුළත් ය (Peter Wormley)

සමාජානුයෝජනය යනු කෙනෙකු අනෙක් අය සමඟ පවත්වන අන්තර් ක්‍රියාවල ප්‍රතිඵල වශයෙන් ඔහුගේ හෝ ඇයගේ හෝ ජීවන චරිතය පුරා වෙනස්කම් ඇති කරවනු ලබන ක්‍රියාවලියකි. එනම් සමාජයේ අනෙකුත් මිනිසුන් සමඟ ජීවත්වීමට පුද්ගලයකු හුරු කිරීමේ ක්‍රියාවලියකි (Secord and Backman).

සමාජයේ බලපවත්වනු ලබන යම් යම් සාරධර්ම, ආකල්ප, අගනාකම්, පිළිබඳ ඉගෙන ගෙන ඒවා තමාගේ චරිතය තුළ අභ්‍යන්තරීකරණය කරගැනීම සමාජානුයෝජනය යි (Talcott Parsons).

දෙමාපියන් පිළිගත් ධර්මතා, අගනාකම්, ආකල්ප දරුවන් විසින් මනෝගමනය කරගෙන යහපත් සුපහන් සිතක් සකස් කරගැනීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනය යි (George Herbert Mead).

සමාජ සමූහයේ ධර්මතාවලට අනුකූලව ජීවත්වීමට පුද්ගලයා ඉගෙන ගන්නේ සමාජානුයෝජන ක්‍රියාවලියෙනි (W.F. Ogbum).

පුද්ගලයා සමාජයේ ඇති ක්‍රියා, ආකල්පයන් යම් යම් රටාවලට අනුකූලව හැඩගස්වා ගන්නා බවත්, එය සමාජානුයෝජනය ලෙස හැඳින්විය හැකි බවත්ය (Emil Durkheim).

සී.එච්. කුලිගේ කැඩපතේ පිළිරුව න්‍යාය, අර්වින්ගොන්මාන්ගේ නාට්‍යමය න්‍යාය, ආදී වශයෙන් සමාජානුයෝජනය පිළිබඳ න්‍යායන් ද රාශියක් ඉදිරිපත්ව ඇත. ඉහත තොරතුරුවලට අනුව සමාජානුයෝජනය ක්‍රියාවලියක් බව වටහාගත හැකි ය. එහි පහත ලක්ෂණ දැකිය හැකි ය.

- ගතික ක්‍රියාවලියක් වීම
- සංකීර්ණ ක්‍රියාවලියක් වීම
- අඛණ්ඩ ක්‍රියාවලියක් වීම ආදිය යි.

## නව යොවුන්විය හා සමාජානුයෝජනය

නව යොවුන් වියෙහි විකාශනය දෙස නැවත හැරී බැලීමේ දී අතීත මානව සමාජයෙහි ළමාවිය ඉතා කෙටි වූ අතර අවුරුදු පහක් තරම් කුඩා වයසේ දී ම ළමයෙකුට වැඩිහිටිත්වය පවරා දී ඇත. පුරාණ රෝමවරුන් අවුරුදු දාහතරේ දී වැඩිහිටි වගකීම් භාර දී වැඩිහිටි සාමාජිකයෙකු ලෙස නව යෞවනයා තම සමාජයට ඇතුළත් කරගෙන ඇත. එසේ ම ග්‍රීසියේ ස්පාටන්වරුන් ද රෝම වැසියන් ද ළමයින්ට ළමා වියේ සිටම යුද පුහුණුව ලබා දෙන ලදි.

වැඩිහිටියන්ට ලබාදෙන්නා වු මෙවැනි පුහුණු කාර්යන් වෙත කුඩා අවධියෙන් ම දරුවන් යොමු කරලීමෙන් ඔවුන් වැඩිහිටිත්වයට ආරෝපණය කර ඇති බව පැහැදිලි වේ. එවිට මෙම සමාජ ක්‍රමය තුළ ළමා කාලයෙන් නව යොවුන් විය කරා එළඹීමක් සිදු වී නැත. ඉන්දියාවේ සාම්ප්‍රදායික ගෝත්‍රවල නව යෞවනය ලෙස වෙන් කළ කාල වකවානුවක් නොමැති අතර ගැහැණු දරුවන් වැඩිවියට පත්වීමත් සමග විවාහය සඳහා මූලික සුදුසුකම් ලබන බැවින් අඩු වයසින් ම ගැහැනු දරුවන් විවාහ කරදී වැඩිහිටි සමාජයට ඇතුළත් කර ගනිති. මෙලෙස දක්නට ඇති විවිධ ඓතිහාසික තොරතුරු අනුව ප්‍රධාන ලෙසින් ම අවබෝධ වනුයේ නව යොවුන් විය යන සංකල්පය විවිධ සංස්කෘතීන්ට අනුව පිළිගනු ලබන්නා වූ ආකාරය වෙනස් වන බවය. එම හේතුව නිසා විවිධ සමාජවල නව යොවුන් විය දීර්ඝ වීම මෙන්ම කෙටි කාලයකට සීමා වීමක් ද සිදු වේ. එසේ ම සමාජ ක්‍රමය අනුව යෞවනත්වය හිමි වීම මෙන්ම අහිමි වීම සිදු වී ඇත. ශාරීරික වශයෙන් යෞවනත්ව ලක්ෂණ අනුව ශරීරයේ පැවැත්ම සිදු වුව ද යෞවනත්වයට වටිනාකමක් හිමි කර දීම සිදු වී ඇත්තේ සමාජ ක්‍රමය මූලික වීමෙනි.

අතීතයේ දී අවුරුදු 16 වන විට එනම් අඩු වයසින් ම සිප් සතර හැදෑරීම අවසන් කරන කුමාරවරුන්ට සුදුසු කුමාරියක් විවාහ කර දීම එකල දෙමාපියන් සතු වගකීම වශයෙන් සලකා ඇත. බෞද්ධ මූලාශ්‍ර අනුව චතුර්වර්ණයන්ට අදාළ ව බ්‍රාහ්මණ තරුණයකු අවුරුදු 16 සම්පූර්ණ වූ පසුව විවාහ දිවියට සුදුසුකම් ලැබූ අතර ක්ෂත්‍රිය තරුණයකු අවුරුදු 22න් ද, වෛශ්‍යය තරුණයකු අවුරුදු 24න් ද

විවාපත් වී ඇති අතර, බෞද්ධ මූලාශ්‍රය අනුව ස්ත්‍රියකගේ විවාහයට එළඹෙන වයස අවුරුදු 16 කි. එසේ ම ශ්‍රී ලංකාවේ මහනුවර අවධියේ තොරතුරු අනුව සෑම සිංහල පුරුෂයෙක් ම අවුරුදු 18-20 දී විවාහ වීම සිදු කර ඇත. පෙරදිග සමාජයේ පමණක් නොව මධ්‍යකාලීන යුරෝපය ද මෙම කෙටි කාලීන යෞවනය හඳුනාගත හැකිවිය. මේ අනුව බලන විට නව යෞවනය යන සංකල්පය අතීතයේ සිට අද දක්වා ම ඒකාකාරයෙන් සපැමිණි සංසිද්ධියක් නො වේ. පුද්ගලයා ජීවත් වන්නා වූ සමාජ ක්‍රමයට අනුරූප ව යෞවනත්වයේ රැඳී සිටින්නා වූ කාල පරාසයන් ද වෙනස් වී ඇත.

යුරෝපීය සංස්කෘතිය ආගමනයත් සමග මෙරට සමාජ, ආර්ථික හා සංස්කෘතික ආදි වශයෙන් විශාල පරිවර්තනයක් සිදු විය. එම වෙනස් වීමත් සමඟ ම වර්තමානයෙහි යොවුන් වියෙහි රැඳී සිටීමේ කාලසීමාව දීර්ඝ වීමට ලක් වී තිබේ. ඒ අනුව තරඟකාරි අධ්‍යාපනය, සමාජ වගකීම් ආදිය හේතු කර ගෙන විවාහය, ලිංගිකත්වය, මාතෘත්වය යන තත්වයන් හි විශාල වෙනස්වීමක් සිදු විය. වර්තමානය වන විට විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියෙහි නියැලෙන පිරිස බහුල වීම සේම පුළුල් අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා ලැබීම නිසා අධ්‍යාපන ප්‍රතිඵල ලැබීමට තරුණ පිරිස් යොමු වීම, රැකියා අපේක්ෂාවෙන් දීර්ඝ කාලයක් රැඳී සිටිම, කෘෂිකර්මය නවීකරණය වීම, ආහාරවල පෝෂණ ගුණය වැඩිවීම සමග ජීවිතාපේක්ෂාව ඉහළ යාමත් හේතු සාධක කර ගනිමින් යොවුන් වියේ රැඳෙන කාල පරාසය දීර්ඝ වීමකට ලක් වී තිබේ.

මෙලෙස බලන විට නව යෞවනය යන සංකල්පය කෙරෙහි පවතින්නා වූ සමාජ ක්‍රමය විශාල බලපෑමක් එල්ල කර ඇති බව පැහැදිලි වේ. අතීතයේ සිට අද දක්වා ක්‍රමානුකූලව දියුණු වෙමින් මානවයා පැමිණි ගමන් මගෙහි දී මුහුණ පෑමට සිදු වූ විවිධ විපර්යාසයන්ට අනුව විවිධ කාල පරාසයන්හි දී නව යොවුන් විය කෙටි කාලයකට සීමා වීම මෙන් ම දිගු කාලයක් රදා පැවැත්ම ද සිදු වී ඇත. සමාජ ක්‍රමය මඟින් යොවුන් වියට හිමි කර දෙනු ලබන වටිනාකම අනුව එය තීරණය වේ. අප ජීවත් වන්නා වූ වර්තමාන සමාජ ක්‍රමය තුළ ප්‍රධාන වශයෙන් ම ඉතා විශාල පිරිසක් යොවුන් විය ඉතා දිගු කාලයක් ගත කරනු ලබන අතර විවිධ දෘෂ්ටිකෝණයන්ට

අනුව බලන විට මෙම තත්ත්වය යහපත් මෙන් ම අයහපත් ප්‍රතිඵල ද ජනිත කරනු ලබයි. උසස් අධ්‍යාපනයට මෙන් ම රැකියාවල නිරත වීමට හැකියාව ලැබීම නිසා යෞවනත්වය තුළ දීර්ඝ කාලයක් රැඳී සිටීමට හැකි වීම සතුටුදායක තත්ත්වයක් ලෙසින් හැඟුණ ද අප ඒකකාරී ජීවන රටාවක් තුළ සිර වී ඇති බව තවත් වරෙක සිතේ. එසේම නිශේධනාත්මක බලපෑම් ද අප සමඟ නොදැනුවත්ව හෝ අත්වැල් බැඳ ගනිමින් සිටි.

ජීවවිද්‍යාත්මක හා සමාජීය සංවර්ධනයට අමතරව, නව යොවුන්වියේ පසුවන්නන් ලිංගිකත්වය, ස්වාධිපත්‍යය සහ රැකියාව පිළිබඳ සම්මත සහ අපේක්ෂා මත පදනම්ව සංස්කෘතීන් හරහා විවිධ අත්දැකීම්වලට යටත් වේ. වර්තමානයේ විශේෂයෙන්ම බටහිරකරණය වූ සමාජවල නව යොවුන් වියේ දරුවන්ගේ අත්දැකීම් සහ සංකල්ප කෙරෙහි මාධ්‍ය සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. නව යොවුන්වියේ අත්දැකීම් සංස්කෘතික සම්මත සහ මාධ්‍ය වැනි බාහිර සාධක මගින් බලපායි.

- නව යොවුන්විය ළමා කාලය සහ පරිණතභාවය අතර කායික හා මානසික වර්ධනයේ සංක්‍රාන්ති කාලයකි.
- වැඩිවිය පැමිණීම පුද්ගලයෙකුට ලිංගික ප්‍රජනනය සඳහා ප්‍රථමයෙන් හැකියාව ඇති වයස

නව යොවුන්විය යනු කායික හා මානසික මානව සංවර්ධනයේ සංක්‍රාන්ති අවධියකි, සාමාන්‍යයෙන් වැඩිවිය පැමිණීම සහ නීත්‍යානුකූල වැඩිහිටිභාවය අතර සිදු වේ. නව යොවුන් වියේ කාලය නව යොවුන් විය සමඟ වඩාත් සමීප ව සම්බන්ධ වී ඇතත්, කාලානුක්‍රමික වයස නව යොවුන්වියේ දළ සලකුණක් පමණක් සපයන අතර විද්වතුන්ට නිශ්චිත නිර්වචනයක් සමඟ එකඟ වීම දුෂ්කර වී ඇත. නව යොවුන් විය සලකනු ලබන්නේ වැඩිහිටි භූමිකා සඳහා දරුවන් සූදානම් කිරීමේ අරමුණින් ළමා කාලය අතර සංක්‍රාන්ති කාල පරිච්ඡේදයක් ලෙස ය. නව යොවුන්වියේ අවසානය සහ වැඩිහිටි වියේ ආරම්භය රට අනුව සහ ක්‍රියාකාරීත්වය අනුව වෙනස් වේ. තනි ජාතික රාජ්‍යයක් හෝ සංස්කෘතියක් තුළ වුව ද, යම් යම් කාර්යන් හැසිරවීමට තරම් (කාලානුක්‍රමික ව සහ නීත්‍යානුකූලව) පරිණත යැයි සැලකෙන විවිධ

වයස් කාණ්ඩ තිබිය හැකි ය. බටහිර රටවල, එවැනි සන්ධිස්ථානවලට වාහනයක් පැදවීම, නීත්‍යානුකූල ලිංගික සම්බන්ධතා පැවැත්වීම, සන්නද්ධ හමුදාවන්හි හෝ ජූරි සභාවක සේවය කිරීම, මත්පැන් මිලදී ගැනීම සහ පානය කිරීම, ඡන්දය ප්‍රකාශ කිරීම, ගිවිසුම්වලට එළඹීම, ඇතැම් අධ්‍යාපන මට්ටම් සම්පූර්ණ කිරීම සහ විවාහ වීම ඇතුළත් වේ. නව යොවුන්වියේදී සාමාන්‍යයෙන් වැඩි ස්වාධීනත්වයක් සහ දෙමාපියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුවන්ගේ අධීක්ෂණය අඩු වේ.

නව යොවුන් වියේ සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයට බොහෝ විට අන්තර් විනය සහයෝගිතා ඇතුළත් වේ. නිදසුනක් වශයෙන්, ස්නායු විද්‍යාව හෝ ජෛව චර්යාත්මක සෞඛ්‍යය පිළිබඳ පර්යේෂකයන් මොළයේ ව්‍යූහයේ වැඩිවිය පැමිණීමේ වෙනස්කම් සහ සංජානනය හෝ සමාජ සම්බන්ධතා කෙරෙහි එහි බලපෑම කෙරෙහි අවධානය යොමු කළ හැකි ය. නව යොවුන් විය ගැන උනන්දුවක් දක්වන සමාජ විද්‍යාඥයන් සමාජ භූමිකා (උදාඃ කම්කරුවා හෝ ආදර සහකරු) අත්පත් කර ගැනීම සහ සංස්කෘතීන් හෝ සමාජ තත්ත්වයන් හරහා මෙය වෙනස් වන ආකාරය කෙරෙහි අවධානය යොමු කළ හැකිය. සංවර්ධන මනෝවිද්‍යාඥයන් පාසල් ව්‍යූහයේ සහ වැඩිවිය පැමිණීමේ තත්වයක් ලෙස දෙමාපියන් සහ සම වයසේ මිතුරන් සමඟ සබඳතාවල වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කළ හැකි ය.

### මිතුරු සබඳතා

නව යොවුන් වියේදී සම වයසේ මිතුරන් විශේෂයෙන් වැදගත් වේ. සම වයසේ මිතුරන් සමඟ ගත කරන කාලය නාටකාකාර ලෙස වැඩි වීම සහ වැඩිහිටි අධීක්ෂණය අඩු වීම මගින් සංලක්ෂිත සංවර්ධන කාල පරිච්ඡේදයකි. නව යොවුන් වියේ පසුවන්නන් ද ළමා කාලයට වඩා විරුද්ධ ලිංගයේ මිතුරන් සමඟ ඇසුරු කරන අතර, හවුල් ලක්ෂණ මත පදනම්ව විශාල සම වයසේ මිතුරන් සමඟ හඳුනා ගැනීමට නැඹුරු වේ. සම වයස් කණ්ඩායම් සාමාජිකයින්ට සංවේදනය, බෙදාගැනීම සහ නායකත්වය වැනි විවිධ සමාජ කුසලතා වර්ධනය කිරීමට අවස්ථාව ලබා දෙයි. අධ්‍යයන අභිප්‍රේරණය සහ කාර්ය සාධනය ඇතුළු ව පුද්ගලයෙකුට ධනාත්මක බලපෑමක් ඇති

කළ හැකි ය. ඔවුන් සෘණාත්මක බලපෑම් ඇති කළ හැකි අතර මත්ද්‍රව්‍ය, මත්පැන්, විනාශ කිරීම සහ සොරකම් කිරීම වැනි අත්හදා බැලීම් වැඩි කිරීමට හේතු විය හැක. නව යොවුන් වියේ මුල් අවධියේදී සම වයසේ මිතුරන්ගේ පීඩනයට ගොදුරු වීමේ හැකියාව වැඩි වන අතර, වයස අවුරුදු 14 පමණ වන විට උපරිමයට පැමිණ, ඉන් පසුව අඩු වේ.

නව යොවුන්වියේ මුල් අවධියේ දී, යොවුන්වියේ පසුවන්නන් බොහෝ විට කල්ලි කණ්ඩායම් ඇසුරු කරයි. ඔවුන් විශේෂයෙන් සමීපව සිටින සම වයසේ මිතුරන්ගේ තනි ලිංගික කණ්ඩායම්, නව යොවුන්වියේ පසු වන විට, යෞවනයන් එකිනෙකා සමඟ ප්‍රේම සම්බන්ධයක් ඇති කර ගැනීමට පටන් ගන්නා විට කල්ලි බොහෝ විට මිශ්‍ර ලිංගික කණ්ඩායම්වලට ඒකාබද්ධ වේ. මෙම කුඩා මිතුරු කණ්ඩායම් සමාජගත වීම ජෝඩු නැඹුරු බවට පත් වන විට තව දුරටත් බිඳ වැටේ. කල්ලි යනු නෛසර්ගිකව සෘණාත්මක බලපෑමක් බවට පොදු මතයක් තිබියදීත්, ඔවුන් නව යොවුන්වියේ දරුවන්ට සමාජීය වශයෙන් හුරුපුරුදු වීමට සහ ශක්තිමත් අනන්‍යතා හැඟීමක් ඇති කිරීමට උපකාරී වේ.

## ආදර සහ ලිංගික ක්‍රියාකාරකම්

නව යොවුන් විය පුරාවට ම ප්‍රේම සබඳතාවන්ගේ ව්‍යාප්තිය වැඩි වේ. වයස අවුරුදු 15 වන විට, නව යොවුන්වියේ සිටින අයගෙන් 53%කට පෙර මාස 18 තුළ අවම වශයෙන් මාසයක්වත් පැවති ප්‍රේම සම්බන්ධයක් තිබේ. 2002 ඇමරිකානු අධ්‍යයනයකින් හෙළි වූයේ පළමු ලිංගික සංසර්ගයේ සාමාන්‍ය වයස පිරිමින් සඳහා 17 ක් සහ කාන්තාවන් සඳහා 17.3 ක් බවයි. පුද්ගලයන් පරිණත යොවුන් වියේ පසුවන විට, දිගුකාලීන සම්බන්ධතාවයක සම්භාවිතාව වැඩි වන අතර, එය ලිංගික පරිණතභාවය සහ ආදර බැඳීමක් පවත්වා ගැනීමට අවශ්‍ය සංජානන කුසලතා වර්ධනය කිරීම මගින් පැහැදිලි කළ හැකි ය (උදා: රැකබලා ගැනීම, සුදුසු බැඳීම). දිගුකාලීන සබඳතා නව යොවුන් වියේ පසුවන ජීවිතයේ උසස් තත්ත්වයේ සබඳතා සඳහා අවශ්‍ය කුසලතා ලබා ගැනීමට සහ ස්වයං වටිනාකම පිළිබඳ හැඟීම් වර්ධනය කිරීමට දායක වීමට ඉඩ සලසයි. නව යොවුන් විය සනිටුහන් කරන්නේ ලිංගික පරිණත භාවයේ කාලයක් වන අතර, එය

නව යොවුන් වියේ දරුවන් පවත්වාගෙන යන සමාජ අන්තර්ක්‍රියා වර්ග කෙරෙහි බලපායි. නව යොවුන් වියේ පසුවන්නන් අනියම් ලිංගික හමුවීම්වල යෙදිය හැකි අතර මෙම සංවර්ධන කාලය තුළ බොහෝ ලිංගික අත්දැකීම් සිදු වන්නේ ආදර සබඳතා තුළ ය.

**ස්වයං පාලනය**

යෞවනයන් තුළ සිත් කැළඹිලි ඇති කිරීමට සමාජ සාධක බෙහෙවින් බලපායි. ශාරීරික, බුද්ධිමය, සාමාජීය පරිණතිය ලබන නව යෞවනයා ළමාවියේ අපේක්ෂා නොකළ ස්වාධීනත්වයක් වැඩිහිටි සමාජයෙන් දෙමව්පියන්ගෙන් අපේක්ෂා කරයි. නව යෞවනයා තවදුරටත් දෙමව්පියන්ට ආසක්තව සිටීමට අපේක්ෂා නොකරයි. දෙමව්පියන්ගේ ආඥාදායක පාලනය ඔවුනට තව දුරටත් රුචි නොවන අතර දෙමව්පියන් හා වැඩිහිටියන් විසින් තමන් කිසියම් වගකීමක් සහිත පිරිසක් ලෙස පිළිගනු ලැබීමට මහත් අභිරුචියක් දක්වති. නව යෞවනයාට ස්වාධීනතාව සඳහා දෙමව්පියන් සහ සටන් කිරීමට සිදුවෙයි. මේ උත්සාහයේ දී ඔහු දෙමව්පියන්ගෙන් ඈත්ව වීමට උත්සාහ ගනි. නිදහස් විශිෂ්ට පුද්ගලයකු ලෙස හැඩගැසීමට ඔහු දරන උත්සාහයේ දී ඔහු දෙමව්පිය අදහස් ප්‍රතික්ෂේප කරයි.

නව යොවුන් වියේ දරුවන් ස්වාධීනත්වය සඳහා වෙහෙසෙති. McElhaney අනුව, ස්වයං පාලනය විස්තර කළ හැකි ආකාර තුනක් ඇත.

- චිත්තවේගීය ස්වාධිපත්‍යය යනු වැඩිහිටියන් හා සම වයසේ මිතුරන් සමඟ වඩාත් වැඩිහිටි සමීප සබඳතා වර්ධනය කිරීම
- චර්යාත්මක ස්වාධීනත්වය යනු ස්වාධීන තීරණ ගැනීමට සහ ඒවා අනුගමනය කිරීමට ඇති හැකියාව
- සංජානන ස්වාධීනත්වය සංලක්ෂිත වන්නේ ස්වාධීන විශ්වාස, සාරධර්ම සහ අදහස් සමූහයක ප්‍රකාශනය සමාජයේ දැක්වෙන ග්‍රාමීය, නාගරික, දුප්පත්කම

පොහොසත් පන්ති රටාව ද නව යෞවනයාට තීරණාත්මක බලපෑමක් ඇතිකරන විචල්‍ය වෙයි. එක් එක් සමාජීය පන්ති ආර්ථික රටාවන්හි ඇගැයුම්, සිරිත් විරිත්, ආකල්ප හා සංස්කෘතික හුරුපුරුදු එකිනෙකට

වෙනස් වන බැවින් සාමාජිකයන් සමග අන්තර් ක්‍රියාකාරීත්වයේ දී නව යෞවනයා අත්විඳින අත්දැකීම් වෙනස් වන බව පැහැදිලිය. ප්‍රකට සමාජ විද්‍යාඥයෙකු වන මාස්ග්‍රෝව්ට්ට අනුව පුද්ගලයෙකුගේ පෞරුෂ සංජානනය හා චින්තනය ආදී මනෝවිද්‍යාත්මක සාධක කෙරෙහි සමාජ පන්ති රටාව බලපායි. ඒ අනුව පුද්ගලයා ළමා කාලයේ දී පටන් ඇති දැඩි වන සමාජ පරිසරය හා රටාව විසින් ද දක්වන සබඳතාව නව යෞවනයා කෙරෙහි බලපෑම් එල්ල කරනු ලබයි.

**සමාලෝචනය**

මේ අනුව පෙනී යනුයේ නව යෞවන අවධියේ ජීවිතය විශේෂ අවශ්‍යතාවන්ගෙන් යුතු අවධියක් බවත් එහෙත් බොහෝ දෙනා සලකන තරම් බර කොට දැක්විය හැකි කැළඹීම් හා කුණාටු සහගත බවක් මෙම අවධියට විශේෂ කොට දැක්වීම පදනම් රහිත ය. නව යෞවනයේ කැළඹීම්වලට නොසන්සුන්වලට පදනම් වන හේතු විවිධ බවත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම එම ගැටලු සමානව බලපාන බවත් පැහැදිලිය. එම තත්ත්වයන් හඳුනාගෙන එම අවධිය තුළ යහපත් සමාජ ඇසුරක් වෙත යොමු කිරීමත් නිරන්තර අවධානය ලබාදීමත් හහා නව යොවුන්විය අර්ථවත් කළ හැකි ය. එමෙන් පුද්ගල සංවර්ධන අවධි අතර තීරණාත්මක සහ වැදගත් අවධියක් වන නව යොවුන්විය පුද්ගලයගේ සමස්ත සංවර්ධනයේ තීරණාත්මක අවධිය වශයෙන් ද සලකනු ලබයි. පුද්ගල සංවර්ධනය තුළ මනෝවිද්‍යාත්මක, චිත්තවේගික සහ කායික වශයෙන් සිදු වන කැපී පෙනෙන වෙනස්කම් දක්නට ලැබෙන මෙම නව යොවුන්විය පුද්ගලයෙකුගේ ජීවිතය තීරණාත්මක අවස්ථාවක් ලෙස සඳහන් කළ හැකි ය. පුද්ගලයා ස්වයංව චින්තනය මෙහෙයවීමට හුරුවන සහ දෙමාපිය ආධිපත්‍යයෙන් ගැලවී ස්වාධීනත්වයට හුරුවන අවධිය වශයෙන් පුද්ගලයා සමාජ සබඳතා ඇති කරන්නා අවධිය ලෙස මෙම නවයොවුන් විය පැහැදිලි කරගත හැකිය. එමෙන් ම සමාජයට නිරාවරණය වන අවධිය වශයෙන් ද මෙම නව යොවුන්විය සඳහන් කළ හැකිය. සියලු ක්‍රියාවලීන්හී දී පුද්ගලයා සමාජය සමග අන්තර් ක්‍රියා සිදු කිරීමෙන් සමාජගත වීමත් පැහැදිලි ව දැක ගත හැකි වන අතර එහි දී විවිධ සමාජ කණ්ඩායම් වෙත යොමු වීමත් සමාජයේ ඇති විවිධ ක්‍රියාකාරකම්වලට පුද්ගලයා යොමු වීමත් ඒ හරහා පුද්ගලයාගේ චින්තන රටාව හා ඉදිරිපත්

වීමේ කුසලතාව ඔප්නැංවෙන ආකාරය හඳුනාගත හැකි ය. මනෝ විද්‍යාඥයන් වැඩි වශයෙන් අවධානය යොමු කළ ඇති මෙම නව යොවුන් විය පුද්ගලයා සමාජයට අනුවර්තනය වන ප්‍රධාන ම අවධිය වශයෙන් හඳුනාගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අතුකෝරාල, දයා රෝහණ සහ හේළි නිමලා. (2015). *අධ්‍යාපන මෙනෝවිද්‍යාව හා ගුරුවරයා.* බොරැල්ල ඃ ශික්‍ෂා මන්දිර ප්‍රකාශන

අබේපාල, රෝලන්ඩ්. (2015). *අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම.* කොට්ටාවඃ සාර ප්‍රකාශන.

අබේපාල, ආර්. (2011). *අධ්‍යාපන මාර්ගෝපදේශනය හා උපදේශනය.* කොට්ටාවඃ සාර ප්‍රකාශන.

අමරසේකර, දයා. (1995). *සරල සමාජ විද්‍යාව.* වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

අමරසේකර, දයා. (1980). *සමාජ විද්‍යාව සරල ශාස්ත්‍රීය ලිපි.* වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

තිලකරත්න, බණ්ඩා. (1996). *ප්‍රායෝගික අධ්‍යාපන මනෝවිද්‍යාව හා නූතන අධ්‍යාපන ව්‍යවහාර.* කොළඹ 10ඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

නාගිත හිමි, මහපුලියන්කුලමේ. (1998). *සමාජ විද්‍යාවේ මූලිකාංග.* කුලියාපිටියඃ තරංග ප්‍රින්ට්ස්.

බස්නායක, ඩී ආර්. (1998). *අධ්‍යාපනය හා මනෝ විද්‍යා නිබන්ධන.* කොළඹ 10ඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, නන්දසේන. (2007). *සමාජවිද්‍යාවේ මූලික සංකල්ප.* කොළඹඃ ඇස් ගොඩගේ ප්‍රකාශකයෝ.

සේනාධීර, සිල්වි. (2010). *අධ්‍යාපනය සඳහා සමාජානුයෝජන කාරකවල වැදගත්කම.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Culture in Sri Lanka. Wikipedia, free encyclopedia, http://en.wikipedea.org/culture in Sri Lanka

https://www.vigayu.com/2020/01/blog-post_58.html